Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර- තාක්ෂණික III වන ශ්‍රේණියේ නිලධාරීන් බඳවා ගැනීම - 2017

(පුරප්පාඩු සංඛ්‍යාව 01 කි)

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික III වන ශ්‍රේණියේ නිලධාරී තනතුරුවල පවතින පුරප්පාඩුව සඳහා මෙහි පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

1.1 *අධ්‍යාපන සුදුසුකම් :*

1.1.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

1.1.2 විද්‍යා/ගණිත විෂය ධාරාවට අයත් විෂයයන් 03 කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

1.2 *වෘත්තීය සුදුසුකම් :*

1.2.1 මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

*හෝ*

1.2.2 ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

*හෝ*

1.2.3 අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

*හෝ*

1.2.4 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

*හෝ*

1.2.5 ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

*හෝ*

1.2.6 රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 වන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

*හෝ*

1.2.7 උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලුම අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

1.3 *කායික සුදුසුකම් :*

1.3.1 සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය වී තිබීම.

1.4 *වෙනත් සුදුසුකම් :*

1.4.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

1.4.2 විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

1.4.3 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2017.01.01 වැනි දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.4.4 යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගයට සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

02. I *වැටුප් පරිමාණය* - රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 -57,550

2020.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාරව

II වැටුප් කේතය (MN - 3-2016)

03. *පොදු කොන්දේසි :*

3.1 *වයස් සීමාව* - 2017.01.01 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

3.2 *බඳවා ගැනීමේ ක්‍රමය :*

3.2.1 ලිඛිත විභාගයකින් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගනු ලැබේ.

3.2.1.1 *විභාග පරිපාටිය :*
විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | | ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය | කාලය |
|---|---|---|---|---|
| (i.) | බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 01 |
| (ii.) | විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | 100 | 40% | පැය 03 |

3.2.1.2 *විෂය නිර්දේශය :*

(i) *බුද්ධි පරීක්ෂණය* - අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වය තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ii) *විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය :*

(අ) *ගොඩනැගිලි ඉදි කිරීම,*
(i) ගොඩොල් බැම්ම හා කළු ගල් බැම්ම. (සංධි මුලු, ආරුක්කු, තෙත් වැටි, ලින්ටල්ස්, ජේකඩ)
(ii) බදාම මිශ්‍රණ වර්ග, කපරාරු සිමෙන්ති දැමීම, කොන්ක්‍රීට් මිශ්‍රණ
(iii) නොයෙක් වර්ග වල සන්ධි කිරීම. පුලුක්කු කිරීම, තට්ටු ගැම, වැද්දීම, කුඩුම්බු කැපීම, යට ලී මුට්ටු කිරීම හා හේත්තු වැද්දීම
(iv) නොයෙක් වර්ග වල වහලවල් (උළු, ඇස්බැස්ටස්, රැලි තහඩු,ඇළුමිනියම් තහඩු, සිංහල උළු, පැතලි කොන්ක්‍රීට්)
(v) පස් වැඩ (තැලීම, මට්ටම් ගැනීම, ප්‍රමිතිය)
(vi) බැම් බැඳීම හා කාණු පද්ධතිය

(ආ) *තීන්ත ආලේප කිරීම,*
නොයෙකුත් වර්ග වල තීන්ත ආලේප කිරීම, බිත්ති ආලේප කිරීම, ද්‍රව ආලේප කිරීම, වාර්නිෂ් ආලේප කිරීම, මළ නොබැඳෙන තීන්ත ආලේප කිරීම, මුද්‍රිත තීන්ත ආලේප කිරීම ආදිය

(ඇ) *ද්‍රව වර්ගීකරණය, ද්‍රව පදම් කිරීම, බිත්තිවලට හා බිමට අල්ලන ටෙරාසෝ පිගන් ගඩොල් ඇල්ලීම පිළිබඳ වූ දැනුම,*

(ඈ) *සපයන ලද දල සටහන් අනුව වැඩ සඳහා සැලසුම්පිළියෙල කිරීම,*

(ඉ) *ප්‍රමාණ පත්‍ර වලට අනුකූලව බිල්පත් සෑදීම ආදිය සඳහා වන ක්‍රියා,*

(ඊ) *මූලික ජල සම්පාදනය හා ජල ප්‍රවාහනය :*
කුඩා පරිමාණයේ ගොඩනැගිලි සඳහා ජල නල, කසල නල යෙදීම, කසල වලවල් ඉදි කිරීම, ජල මුද්‍රිත උපකරණ, ජල ටැංකි හා ළිං ආදිය.

3.2.1.3 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :*

ලිඛිත පරීක්ෂණයේ ලකුණු පදනම් කරගෙන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් කරනු ලබන්නේ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවකි. (ලකුණු ලබා දෙනු නොලැබේ.)

04. *තේරීමේ පරිපාටිය :*

4.1 ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින්, පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු ගණනට සමාන අයදුම්කරුවන් ගණන, ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේ දී මූලික සුදුසුකම් සනාථ කළ නොහැකි වන අයදුම්කරුවන් විභාගයේ දී නියමිත කුසලතා මට්ටම් ලබා සිටිය ද බඳවා ගනු නොලැබේ.)

05. *අයදුම්පත්‍ර සකස් කිරීම/අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීම :*

5.1 ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ය.

5.2 සිංහලෙන්, දෙමළෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂයේ සඳහන් විභාගයේ නම එම භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

5.3 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුතු ය.

5.4 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට් කළ* තනතුරක් දරන නිලධාරියකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

5.5 *සාවද්‍ය තොරතුරු සැපයීම :*
මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් හෝ ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයට පසුව හෝ ඔහු/ඇය ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද සේවයට බඳවා ගත් පසුව ඒ බව අනාවරණය

වුවහොත් සේවයෙන් පහ කිරීමට ද ඉඩ ඇත.

06. *අයදුම්පත් යොමු කිරීම :*

6.1 අයදුම්කරුවන් විසින් මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2017.04.28 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

6.2 අයදුම්පත්‍ර යොමු කිරීම :
අධ්‍යක්ෂ ජනරාල්,
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07.

6.3 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික III වන ශ්‍රේණියේ නිලධාරීන් බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතු ය.

6.4 සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

07. *අයදුම්පත් භාර ගැනීම හා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම :*

7.1 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතු ය.

7.2 ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

08. *විභාගයට පෙනී සිටීම :*

8.1 මෙම විභාගය පැවැත්වෙන දිනය හා ස්ථානය සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙත පසුව දැනුම් දෙනු ලැබේ.

8.2 විභාග අපේක්ෂකයින් විභාගයට පෙනී සිටීමට ප්‍රථම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු ය. විභාග මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඔබට අවසර නොලැබෙනු ඇත. තව ද, අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේ දී විභාග යට පෙනී සිටිය යුතු ය.

8.3 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාගය පවත්වන ආයතනය විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති උල්ලංඝනය කළහොත් පනවනු ලබන දඬුවමකට විභාග අපේක්ෂකයා/අපේක්ෂිකාව යටත් විය යුතු ය.

09. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*

විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

10. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

11. සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පලවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

12. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

12.1 මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු ය.

12.2 සේවා කොන්දේසි

සෑම පත්වීමක්ම සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

13. තමා දැනුවත්ව ඉදිරිපත් කරන ලද යම් කිසි තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු/අයදුම්කාරිය හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් එසේ නැතහොත් නුසුදුසු බව සේවය කරන කාලය තුළ කවර අවස්ථාවක දී හෝ ඔප්පු වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

එස්. ඊ. ආර්. ටී. එම්. එස්. පී. බණ්ඩාර,
අධ්‍යක්ෂ ජනරාල්.

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 09,
පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

*ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව*

අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික III වන ශ්‍රේණියේ නිලධාරින් බඳවා ගැනීම - 2017

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය — සිංහල - 2
(කොටුව තුළ අදාළ අංකය යොදන්න) — දෙමළ -3

01. සම්පූර්ණ නම :

02. (අ) මුලකුරු සමග නම : *උදා.-* (GUNAWARDANA M.G.B. S. K)
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් පිරවිය යුතුයි)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

03. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

04. ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ - 0

ස්ත්‍රී - 1 (කොටුව තුළ අදාළ අංකය ලියන්න)

05. ස්ථිර ලිපිනය :

*(අ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
*(ආ)* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
*(ඇ)* දුරකථන අංකය :————.

06. උපන් දිනය :
*(අ)* වර්ෂය :————. මාසය :————. දිනය :————.

*(ආ)* 2017.01.01 දිනට වයස
අවුරුදු :————. මාස :————. දින :————.

07. විවාහක/අවිවාහක බව : විවාහක - 1
අවිවාහක - 2

(කොටුව තුළ අදාළ අංකය ලියන්න)

08. ජන වර්ගය :

සිංහල - 1 ද්‍රවිඩ - 2 වෙනත් - 3 (කොටුව තුළ අදාළ අංකය ලියන්න)

09. *අධ්‍යාපන සුදුසුකම්* :

(*අ*) අ.පො.ස. (සා පෙළ) විභාගය :

වර්ෂය :————.

විභාග අංකය :————.

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(*ආ*) අ.පො.ස. (උ. පෙළ)

වර්ෂය :————.

විභාග අංකය :————.

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10. *වෘත්තීය සුදුසුකම්/තාක්ෂණික සුදුසුකම්* : (අදාළ සහතිකවල, සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කරන්න)

10.1 ලබා ඇති ඩිප්ලෝමාව :————.
10.2 අදාළ ඩිප්ලෝමාව පිරිනමනු ලැබූ ආයතනයේ නම :————.
10.3 අදාළ ඩිප්ලෝමාව වලංගු දිනය :————.
10.4 අදාළ ඩිප්ලෝමාවේ (NVQ) මට්ටම :————.

11. වෙනත් සුදුසුකම් :————.

12. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා හෝ දැනට ඔබට එරෙහිව සිදු කෙරෙමින් පවතින අධිකරණ ක්‍රියාමාර්ග යක් පවතී ද? ඔව්/නැත

12.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
(ආ) මා විසින් ලබා ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.
(ඇ) තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.
(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :————. අයදුම්කරුගේ අත්සන :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................ නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ............... දින මා ඉදිරිපිට අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.